1

## 1.10 විශේෂාංග රූප සටහන
## ප්‍රධාන දර්ශක මගින් පෙන්නුම් කරන රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයේ වැඩි දියුණු වීම

### පුනරාවර්තන වියදම මුළු ආදායමේ % ලෙස




### පොලී ගෙවීම් මුළු ආදායමේ % ලෙස




### පොලී ගෙවීම් පුනරාවර්තන වියදමේ % ලෙස




### මධ්‍යම රජයේ ණය ද.දේ.නි.යෙහි % ලෙස




ආර්ථික අර්බුදයට පෙර පැවති කාලපරිච්ඡේදය සමස්තයක් ලෙස ව්‍යුහාත්මක අසමතුලිතතාවයන් විසඳීමේ සීමිත ප්‍රගතියක් පැවති, රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයේ මන්දගාමීත්වයක් පෙන්නුම් කළ අවධියකි. කොරෝනා වසංගත කාලය සහ ඉන් අනතුරුව ඇති වූ ආර්ථික අර්බුදය හමුවේ රාජ්‍ය මූල්‍ය දර්ශක කැපී පෙනෙන ලෙස දුර්වල වූ අතර, රජයේ මූල්‍ය කටයුතු මත ඇති වූ පීඩනය ඉස්මතු කරමින් පොලී වියදම රජයේ ආදායමේ ප්‍රතිශතයක් ලෙස සහ රජයේ ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. රාජ්‍ය මූල්‍ය අංශය මත පැවති පීඩනය කැපී පෙනෙන ලෙස අඩු කිරීම සඳහා අර්බුදකාරී කාලපරිච්ඡේදයට පසුව ක්‍රියාත්මක කරන ලද ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග දායක වී ඇත. රජයේ මුළු ආදායම පුනරාවර්තන වියදම ඉක්මවා ගිය අතර, පුනරාවර්තන වියදම රජයේ ආදායමේ ප්‍රතිශතයක් ලෙස 95.4%ක් දක්වා අඩු වෙමින් එය මෑත කාලීනව වාර්තා වූ අවම අගය බවට පත් විය. ආර්ථික අර්බුදය පැවති කාලපරිච්ඡේදය තුළ දී සමස්ත රාජ්‍ය ආදායමෙන් අධිකට වඩා වැඩි ප්‍රමාණයක් වැය වූ පොලී වියදම ක්‍රමයෙන් අඩු වී ඇති අතරම, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රජයේ ණය ප්‍රමාණය පහළ යෑම සමස්ත රාජ්‍ය මූල්‍ය තත්ත්වයන්ගේ වැඩිදියුණු වීම පෙන්නුම් කරයි. මෙම දර්ශක මගින් දැනට ක්‍රියාත්මක වන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා වැඩසටහන ඵලදායී වී ඇති බව පෙන්නුම් කරන අතර, මෑත කාලයේ දී ඇති වූ ආර්ථික අර්බුදයේ දී අත්විඳි රාජ්‍ය මූල්‍ය අසමතුලිතතා හේතුවෙන් සිදු විය හැකි අනාගත අහිතකර සාර්ව ආර්ථික ප්‍රතිවිපාක සිදු වීමේ සම්භාවිතාවය ද අඩු වී ඇති බව පෙන්නුම් කරයි.